## බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2015 අප්‍රේල් මස 28 දින පෙ.ව.9.30ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

0 ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්, ජලසම්පාදන හා ජලාපවහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් 2015.03.17 දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/VI (1) /15/07)

අ) ගරු නිමල් ලාන්සා අමාත්‍යතුමා V වන පළාත් සභා කාලය තුළ දරන ලද විෂයයන් භාර අමාත්‍යවරයා වශයෙන් තම ධුරයේ කටයුතු සඳහා විදේශ ගත වූ අවස්ථා ගණන කීයද?

ආ) විදේශ ගත වූ රට , කුමන දිනවලද? ඒ අනුව විදේශ ගතව සිටි දින ගණන කවරේද?

ඇ) එකී දිනයන්හි සහභාගි වූ වැඩ සටහන් කවරේද?

ඈ) අමාත්‍යවරයා සමග විදේශ සංචාර වෙනුවෙන් සහභාගීවූ අනෙකුත් අය කවුරුන්ද?

ඉ) ඒ ඒ සංචාර සඳහා වැයකළ මුදල කොපමණද?

ඊ) සංචාරයන් සඳහා වැයකළ මුළු මුදල කොපමණද?

උ) ඒ ඒ සංචාර මගින් පළාත් සභාව වෙත ලැබුණු ප්‍රතිලාභ කවරේද?

ඌ) නොඑසේ නම් ඒ මන්ද?

**02.** ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2015.04.07 දින අසන ලද ප්‍රශ්නය: (ප්‍ර/VI (1) /15/11)

කළුතර දිස්ත්‍රික්කයේ ඇති පාසැල් අතරින්

අ. පාසැලේ සුබසාධන කටයුතු සඳහා 2015 මාර්තු 01 වන විට බස්රථ හිමිව ඇති පාසැල් මොනවාද?

ආ. ඒවා පාසලට ලැබී ඇත්තේ කවදාද?

ඇ. එම බස්රථ වර්ගය සහ ඒවායේ අංක මොනවාද?

ඈ. එම බස්රථ පාසලට ලැබුනේ රජයෙන්ද ආදි ශිෂ්‍ය සංගම් අරමුදලෙන්ද නැත්නම් පෞද්ගලික ධන පරිත්‍යාගයෙන්ද යන්න වෙන් වෙන්ව දක්වන්නේද?

ඉ. පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් නම් එම පරිත්‍යාගශීලීන් කවුද යන්න පාසැල්වලට අදාලව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද?

ඊ. එම බස් රථ අතරින් කවර ඒවා ධාවන තත්වයේ පවතීද?

**03.** ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂයභාර අමාත්‍යතුමාගෙන් ඇසීමට: (ප්‍ර/VI (1) /15/14)

අ. කොළඹ අධ්‍යාපන කලාපයේ දෙමටගොඩ අනුරුද්ධ බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනියගේ විෂමාචාර කටයුතු සහ අවිධිමත් විනය විරෝධී කටයුතු නිසා පාසැලේ ගුරුවරුන් හා සිසුන් අතර අසමගිය හා භේදකිරීම් ඇතිකර ඇති බව, ඔබතුමා දන්නවාද?

ආ. මේ නිසා පාසැලේ පරිපාලනයත්, දරුවන්ගේ අධ්‍යාපනයත්, කඩාවැටී ඇති බව ඔබතුමා දන්නවාද?

ඇ. මෙම විදුහල්පතිනියගේ විෂමාචාර චෝදනා රාශියක් දිර්ඝ කාලයක් තිස්සේ දිගින් දිගටම තිබියදී, ඒ පිලිබඳව ගත් ක්‍රියාමාර්ග මොනවාද?

ඈ. මෙම විදුහල්පතිනියට එරෙහිව ඉදිරිපත්කර ඇති, විෂමාචාර චෝදනා පිළිබඳව ඉක්මනින් අදාළ පරීක්‍ෂණ සිදුකර විසඳුමක් ලබාදෙනවා වෙනුවට පාසැලේ හොඳින් කටයුතු කරමින් සිටින ගුරුවරුන්ට එරෙහිව, විමර්ශනයක් සිදුකරන්නේ මන්ද?

ඉ. මෙම විදුහල්පතිනියට එරෙහිව විෂමාචාර සම්බන්දයෙන් චෝදනා ඉදිරිපත්කර සැලකිය යුතු කාලයක් ගතවී තිබියදීත්, ඒ සම්බන්ධයෙන් විධිමත් විනය ක්‍රියාමාර්ගයක් මෙතෙක් නොගැනීමට හේතු, මෙම සභාවට ඉදිරිපත් කරනවාද?

ඊ. එසේ නොමැතිනම් ඒ මන්ද?

04. ගරු හෙක්ටර් බෙත්මගේ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂයභාර අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/15)

- අ. මහරගම විද්‍යාකර බාලිකා විදුහලේ (තිලම්මහර ප්‍රාථමික අංශයද ඇතුලත්ව) දැනට සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද?
- ආ. එම ගුරුවරුන් අතරින් 2014-12-31 දිනට එම විදුහලේම අවුරුදු 10 ඉක්මවමින් සේවය කරනු ලබන ගුරුවරු සිටීද?
- ඇ. එසේනම් ඒ කොපමණද?
- ඈ. එසේ සිටි නම් වසර 10ක් එකම සේවා ස්ථානයේ සේවය කරනු ලබන ගුරුවරුන් මාරුකිරීමේ ප්‍රතිපත්තිය මත ඔවුන් වෙනත් පාසැල් වලට ස්ථානමාරු නොකලේ මන්ද?
- ඉ. එම ගුරුවරුන් කඩිනමින් ස්ථානමාරු කිරීමට කටයුතු කරන්නේද?
- ර. නොඑසේනම් ඒ මන්ද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ රැස්වීම් (I)

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

යෝජනාව: "මින් පෙර කිනම් තීරණයක් ගෙන තිබුනද, ඒ කිසිත් නොතකා, 2015.04.08 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී, ලද එකඟතාවයට අනුව, අද දින (2015.04.28 දින) විසිර යාමෙන් අනතුරුව, මෙම සභාව 2015.05.12 දින පෙ.ව.9.30ට රැස්විය යුතු අතර, 2015.05.05 දිනය, සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් විය යුතුය."

## සභාවේ රැස්වීම් (II)

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට:**

යෝජනාව :

"2015-04-08 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී ලද එකඟතාවයට අනුව, 2015.05.12 දින සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන්ව විසිර යෑමෙන් අනතුරුව, මෙම සභාව, 2015.05.26 දින පෙ.ව 9.30ට රැස්විය යුතු අතර, 2015.05.19 දිනය සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් ලෙස, සලකා ක්‍රියා කළ යුතුය."

## X . පොදු කටයුතු

01. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප),

"බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2014 අංක .............. දරන බදු උකස්ගන්නන්ගේ ප්‍රඥප්තිය"

(දෙවනවර කියැවීම)

[ප්‍රඥප්ති කෙටුම්පත පළමුවර කියැවීම 2014.07.08 දින සිදුකර ඇත.]

## XI. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

### 01. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා:

" බස්නාහිර පළාත තුළ මේ වන විට පාසැල් දරුවන්ගෙන් දෙමාපියන්ගෙන් විටින්විට මුදල් අයකිරීම් සිදුවේ, පළමුවන ශ්‍රේණිය, හයවන ශ්‍රේණිය සහ දොළොස්වන ශ්‍රේණිය සඳහා දරුවන් ඇතුලත්කර ගැනීමේදී මෙන්ම වෙනත් පන්තිවල අවශ්‍යතා සඳහාද දරුවන්ගේ දෙමවුපියන්ගෙන් මෙලෙස මුදල් එකතුකිරීම නිසා ඔවුන් දැඩි දුෂ්කරතාවයකට පත්ව ඇත. එබැවින් බස්නාහිර පළාත තුල දරුවන්ගේ දෙමවුපියන්ගෙන් මුදල් එකතුකිරීම (පහසුකම් ගාස්තු හැර) නතර කළ යුතුයැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි "

(යෝ/VI (1) /14/09)

### 02. ගරු ලක්ෂමන් නිපුණ ආරච්චි මන්ත්‍රිතුමා:

" බස්නාහිර පළාත් පාසැල් සඳහා 1 වන ශ්‍රේණියට ළමුන් ඇතුලත්කර ගැනීමේදී දරුවන් හා දෙමවුපියන් පීඩාවට පත්කරන වර්තමාන ක්‍රමවේදය වෙනස්කිරීමේ අවශ්‍යතාවය මතුව ඇත. ඒ සඳහා දරුවන් පාසලට ඇතුලත්කර ගන්නා දින සිට මාසයක් ඉක්ම යාමට පෙර සියලු පුරප්පාඩු පුරවා අවසන් කිරීමත්, ආරක්ෂක අංශවල සේවයේ නියුක්ත වුවන්ගේ දරුවන්ගේ නාම ලේඛනය දරුවන් ඇතුලත් කර ගත් දිනයේ සිට සති 3 ක් ඉක්ම යාමට පෙර පළාත් සභාවට ලැබීමට සැලැස්වීමත්, පාලක පක්ෂ මන්ත්‍රිවරුන් විසින් ඉදිරිපත් කරන නාම ලේඛණයට අනුව ළමුන් ඇතුලත් කර ගන්නා ක්‍රමය අහෝසි කිරිමත්, සම්මුඛ පරීක්ෂණ වලට සහභාගි වන සැම දරුවෙකුටම ලැබෙන ලකුණු අනුව ස්ථිර ලේඛනයක් ලකුණු අනුපිළිවෙලට අනුව සකස් කිරීමත් ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව පාසලට දරුවන් ඇතුලත් කිරීමට පියවර ගැනීමත් කළ යුතුයැයි ද, ඒ අනුව බස්නාහිර පළාතේ පාසැල්වල පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීමේ කටයුතු විධිමත් කර පාසලකට දරුවෙකු ඇතුලත් කිරීමට තිබෙන මානව අයිතිය පළාතේ ජනතාවට තහවුරු කළ යුතු යැයි ද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි. "

(යෝ /VI (1) /14/10)

## XII. සභාව කල් තැබීම

කේ.එම්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2015.04.08 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.